**ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් (පුද්ගලික) සමාගම- 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා දේශගුණික අරමුදල් (පුද්ගලික) සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත අංක 17 හි 3.1 ඡේදයේ (b), (c), (d) වගන්ති අනුව, වාහන සම්බන්ධ ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී වාහනවලට අදාළ ක්ෂය ප්‍රතිපත්තියද ඇතුළත් කර ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිති අනුව වාහන සම්බන්ධ ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |
| (ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත අංක 28.3(a) අනුව සමාගම විසින් සේවක පාරිතෝෂික දීමනා ගෙවීම් සඳහා වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. | සමාගම විසින් ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා බව. | පාරිතෝෂික දීමනා ගෙවීම් වෙන්කිරීම් සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගිණුම් ප්‍රමිති අංක 4.4 වගන්තිය අනුව රු.10,000,000 ක ස්ථාවර තැන්පතුව ජංගම නොවන වත්කම් ලෙස දැක්විය යුතු වුවද, ජංගම වත්කම්වල මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වටිනාකම රු.10,000,000 ක ස්ථාවර තැන්පතුව ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා වෙන්කිරීමක් කර නොතිබුණු අතර පෙර වර්ෂයට අදාළව වෙන්කළ විගණන ගාස්තු ගෙවීමට | ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස අවසන් ගිණුම් තුළ පෙන්වා දී ඇති රු.150,000 ක මුදල පෙර වර්ෂවලට අදාළව | වාර්ෂිකව විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් කර ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු විගණන ගාස්තු වන බව හා 2020 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන් කිරීමට කටයුතු කරනු ලබන බව. | |
| (ආ)ජංගම නොවන වත්කම් තුළ ඇතුළත් රු.5,311,485 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වී තිබුණද, එම වත්කම් ප්‍රත්‍යාගණනය කර අවශ්‍ය ගැලපීම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය වාර්තාවලට අතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කර අවශ්‍ය ගැලපුම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශන සටහන් අනුව දේපළ පිරියත හා උපකරණ තුළ ඇතුළත් රු.209,000 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍රය හා රු.46,410 ක් වටිනා තිර රෙදි විගණනය වෙත ඉදිරිපත් කරන ලද ඉන්වෙන්ට්‍රි ලේඛනය තුළ ඇතුළත් කර නොතිබුණි. තවද, ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව රු.1,029,600 ක් වූ පරිගණක හා මුද්‍රණ යන්ත්‍රවල වටිනාකම රු.1,223,800 ක් වශයෙන් රු.194,200 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | මෙම අයිතම්වල වටිනාකම් සඳහන් කරමින් ඉන්වෙන්ට්‍රි ලේඛනය ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව ඉන්වෙන්ට්‍රි ලේඛනයට හා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සමාගමේ ආදායම | 4,172,827 | 2,207,780 | 1,965,047 | මෙම විශ්ලේෂණය සත්‍ය වශයෙන් මුදල් ලැබීම් පදනම් කරගෙන සකසා තිබීමෙන් නිකුත් කර ඇති ඇතැම් ඉන්වොයිස් අගයන් හා ඉදිරි වර්ෂවල මුදල් ලැබීම් සටහන් වී නොමැති බව හා නිවැරදිව සකසන ලද විශ්ලේෂණයන් ඉදිරියේදී විගණනය වෙත ලබාදීමට කටයුතු කරන බව. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) අංක3.1(i) මාර්ගෝපදේශය | 2022 සැප්තැම්බර් 08 දින වන විටත් සමාගමේ බඳවාගැනීමේ පටිපාටිය හෝ කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | බඳවාගැනීමේ පරිපාටිය හා කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) අංක 4.2 මාර්ගෝපදේශය | රාජ්‍ය සමාගම් සඳහා අදාළ කරගත යුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 01/2021 මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය වෙනුවට රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවලට අදාළ අංක DMA/01-2019 දරන චක්‍රලේඛය පදනම් කරගනිමින් විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය සකස් කර තිබුණු අතර විගණන හා කළමනාකරණ කමිටු පත් කිරීමේ ලිපිය ප්‍රකාරව කමිටු සාමාජිකයන්, නිරීක්ෂකයන් හා කමිටු කැඳවුම්කරු ද පැහැදිලිව දක්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව විගණන හා කළමනාකරණ කමිටුව පත්කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 771,256 පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.6,715,967 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,487,223 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ව්‍යාපෘති සම්බන්ධ සෘජු පිරිවැය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 76.73 කින් අඩුවුවද, පෙර වර්ෂයේ 13,010,802 ක් වූ ආදායම් උත්පාදනය සමාලෝචිත වර්ෂයේදී රු. 4,727,468 ක් දක්වා රු.8,283,334 කින් හෙවත් සියයට 63.66 කින් පහත වැටීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2007 මැයි 24 දිනැති අංක 14/2007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3(1)(ආ) ඡේදයට අනුව අරමුදල ස්ථාපිත කිරිමේ කාර්යපටිපාටි කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අරමුදල ස්ථාපිත කිරීමේ කාර්ය පටිපාටි කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා කාබන් අරමුදල් පුද්ගලික සමාගම නමින් රුපියල් මිලියන 25 ක මුදලක් සාමාන්‍ය කොටස් නිකුතු ප්‍රාග්ධනයක් ලෙස 2011 දෙසැම්බර් 31 වන දින මහා භාණ්ඩාගාර ලේකම් නමින් කොටස් සහතිකයක් නිකුත් කර තිබුණි. 2015 ජනවාරි 16 දින සමාගමේ නම ශ්‍රී ලංකා දේශගුණික අරමුදල පුද්ගලික සමාගම ලෙස වෙනස් කර තිබුණද කොටස් සහතිකය ශ්‍රී ලංකා කාබන් අරමුදල පුද්ගලික සමාගම නමින් පවතින බව නිරික්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | කොටස් නිකතු සහතිකය සමාගම නමින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ලංකා බැංකු ගිණුමට අදාළව 2019 වර්ෂයේ සිට පවතින රු.362,036 ක් වටිනා නිකුත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත්වලට අදාළ අගය ආදායමට බැර කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව නිකුත් කළ නමුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත් ආදායමට බැර කළ යුතුය. |